සැ. යු. - 2021.11.12 දින පළ වූ අංක 2254 දරන *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවී ය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,255 - 2021 නොවැම්බර් මස 19 වැනි සිකුරාදා - 2021.11.19**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 584 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 586 |

*සැ. යු.*- (i) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක (සංශෝධන) පනත් කෙටුම්පත 2021 නොවැම්බර් මස 19 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) පළාත් සභා (මුද්දර ගාස්තු මාරු කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත නොවැම්බර් මස 19 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2021 දෙසැම්බර් මස 10 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 නොවැම්බර් මස 26 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## සිවිල් නඩු විධාන සංග්‍රහයේ අංක 255 වැනි වගන්තිය යටතේ පිස්කල් විසින් කරනු ලබන පිස්කල් වෙන්දේසියේ විකිණීම

කුලියාපිටිය දිසා අධිකරණයේ දී ය.

කුලියාපිටිය තැපැල් දණ්ඩගමුව ජයකොඩිවත්ත,
පදිංචි තෙලෙඹුගහමුල වත්තේ ගෙදර සෝමරත්න,

නඩු අංකය : 400/ උකස්
ස්වභාවය : උකස්
වටිනාකම : රු. 1,620,000.00
ඇස්කීසි අංකය : 07/2001

*...............පැමිණිලිකරු.*

*එදිරිව*

උඩුබද්දාව තැපැල් උඩුබද්දාව නවලංකා හෝටලය හි
පදිංචි හේවා වෙදගේ විනීතා ධම්මිකා.

*..................විත්තිකාරිය.*

*ඉහත නම සඳහන් විත්තිකාරිය වෙතය.*

ඉහත අංක දරන නඩුවේ වර්ෂ 2019.08.30 වැනි දින ඇතුළත් කරන ලද සමථ තීන්දුව අනුව මා වෙත නිකුත් කර ඇති දේපළ තහනමට ගෙන විකිණීමේ ඇස්කීසියේ බලය පිට පැමිණිලිකරුට අය විය යුතු රු. 1,620,000 ක (රු. දහසය ලක්ෂ විසිදහසක) මුදල ද, නෛතික පොළිය වශයෙන් වූ රු. 81,184.18 ක් ද නඩු ගාස්තු වශයෙන් රු. 20,502.50 ක් ද ඇතුළුව මුළු මුදල වශයෙන් රු. 1,721,686.68 ක් සහ ඇස්කීසි ගාස්තු ද විත්තිකරු විසින් ගෙවිය යුතු බවට නියෝග කොට ඇති හෙයින් ද ඒ අනුව ඉහත නම සඳහන් විත්තිකාරියට අයත් මා විසින් දැනටමත් තහනමට ගන්නා ලද පහත උපලේඛනයේ සඳහන් වන නිශ්චල දේපළ පිස්කල් වෙන්දේසියේ විකුණා පැමිණිලිකරුට අයකර දීම සඳහා මෙහි පහත උපලේඛනයේ සඳහන් දේපළ

**වර්ෂ 2021 ක් වූ දෙසැම්බර් මස 03 වැනි දින පෙ.ව. 11.00 ට** එකී දේපළ පිහිටා ඇති ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පල හත්පත්තුවේ, යගම්පත්තු කෝරලේ, උඩුබද්දාව ප්‍රාදේශීය සභා සීමාවේ සහ උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කප්පන්ගමුව ග්‍රාම නිලධාරී වසමේ කප්පන්ගමුවේ පිහිටි කජුගහමුල වත්ත කියන ඉඩමට එස්. එම්. දිසානායක බලයලත් මිනින්දෝරු තැන විසින් වර්ෂ 1998.12.28 වැනි දින මැන සාදන ලද අංක 7187 දරණ පිඹුරේ සඳහන් ඉඩමේ කොටසට මායිම්,

උතුරට රතුපොල සිට කහදෙනිගම දක්වා දිවෙන ප්‍රාදේශීය සභා පාර ද, නැගෙනහිරට රතුපොල සිට කහදෙනිගම දක්වා දිවෙන ප්‍රාදේශීය සභා පාර ද, දකුණට කප්පන්ගමුව රජයේ පාසල ද, බස්නාහිරට ධර්මවර්ධන අප්පුහාමිගේ උරුමකරුවන්ට අයිති ඉඩම ද, යන මායිම් තුළ පිහිටි පර්චස් දහඅට (අ.00, රූ.00, ප.18) ක් විශාල ඉඩම සහ ඊට අයත් සෑම සියලු දේත් වේ.

දේපළ පිහිටීම:- කුලියාපිටිය සිට මාදම්පේ දක්වා දිවෙන මහා මාර්ගයට පැමිණ වම් පැත්තට කි.මී. 07 ක් පමණ ඉදිරියට යන විට හමුවන කහදෙනි ගමට යන තුංමන් හන්දියෙන් දකුණට හැරී කි.මී. 02ක් පමණ ඉදිරියට යන විට හමුවන කහදෙනිගම තුංමන් හන්දියේම වම් පැත්තේ මෙම දේපළ පිහිටා ඇති අතර, එම ස්ථානයට පහසුවෙන් ප්‍රවේශ විය හැකිය.

ගෙවීම් ක්‍රමය:- වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් (i) ගැණුම් මිලෙන් 25% ක් ද (ii) සිවිල් නඩු විධාන සංග්‍රහයේ අංකඃ 258 වගන්තිය ප්‍රකාරව පිස්කල් ගාස්තු ද; (iii) ප්‍රචාරණ වියදම්, පළාත් අධිකාරියේ බදු සඳහා 1% ඇතුළු විකුණුම සඳහා වන සියළු වියදම් ද මුදලින් ගෙවිය යුතුය. තවද ගැණුම් මිලෙන් ඉතිරි 75% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 (තිහක්) ඇතුළත එකී නඩුවේ බැරට අධිකරණයේ තැන්පත් කල යුතුය. නියමිත කාල සීමාව තුළ එකී 75% ක මුදල නෙගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට පැමිණිලිකරුට අයිතිය ඇත.

එච්. පී. ඩී. අබේරත්න (සා.වි),
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය, කුලියාපිටිය.

වර්ෂ 2021 ක් වූ නොවැම්බර් මස 09 වැනි දින දී ය,

11-647

**සිවිල් නඩු විධාන සංග්‍රහයේ අංක 255 වැනි වගන්තිය යටතේ**
**පිස්කල් විසින් කරනු ලබන පිස්කල් වෙන්දේසියේ විකිණීම**

සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන

බස්නාහිර පළාතේ වාණිජ මහා අධිකරණයේ දී ය.

නඩු අංකය : CHC/382/2012/MR

පීපල්ස් මර්චන්ට් ෆයිනෑන්ස් පී එල් සී
(පෙර පීපල්ස් මර්චන්ට් පී එල් සී සහ පීපල්ස් මර්චන්ට් බෑන්ක් පීඑල්සී ලෙස හඳුන්වනු ලැබූ),
අංක 21, නවම් මාවත,
කොළඹ 02.

...................*පැමිණිලිකරු.*

*එදිරිව*

රත්නායක මුදියන්සේලාගේ මහින්ද තිලක් කුමාර උඩුගම,
අංක 45, මාපානාවතුර කොට්ඨාසය, මහනුවර
තවද
සුපර් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් බාරේ,
ගම්පොල පාර, පල්ලේගම, නාවලපිටිය.

......................*විත්තිකරු.*

ඉහත අංක දරන නඩුවේ 2014.05.28 වැනි දින ඇතුළත් කරන ලද නඩු තීන්දුව අනුව මා වෙත නිකුත් කර ඇති දේපළ තහනමට ගෙන විකිණීමේ ඇස්කිසියේ බලය පිට පැමිණිලිකාර සමාගමට අය විය යුතු පැමිණිල්ලේ ආයාචනයේ අයැද ඇති පරිදි 2012.06.19 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිමකරන තෙක් 39.5% වාර්ෂික පොළී අනුපාතිකයක් සමග රු. 20,453,221.82 ක මුදලක් සහ නඩු ගාස්තු ද පැමිණිලිකරු වෙත ගෙවීමට නියෝග කොට ඇති හෙයින් ද, ඒ අනුව ඉහත නම සඳහන් විත්තිකරුවන්ට අයත් දැනටමත් තහනමට ගෙන ඇති පහත උපලේඛනයේ සඳහන් වන දේපළ පිස්කල් වෙන්දේසියේ විකුණා පැමිණිලිකාර සමාගමට අයකර දීම සඳහා

**වර්ෂ 2021 ක් වූ දෙසැම්බර් මස 17 වැනි දින පෙ.ව. 11.30 ට** එම දේපළ පිහිටා ඇති ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පස්බාගේ කෝරළේ, වරකාව ගමේ පිහිටි උඩහවත්ත කෙහෙල්බිබිලේ හේන *හෙවත්* වත්ත කෙහෙල්බිබිලේ, කඩවලමුල්ලේ හේන සහ ගලබොඩ පුහුකෙස්ගහමුල්ල හේන යන ඉඩම් ඒකාබද්ධ කොට ඇති දැනට එකම දේපළක් ලෙස හඳුන්වන පොලනේගොල්ල, වත්ත නැමති ඉඩමට මායිම්, නැගෙනහිරටඃ නතාර් සයිබෝ ට අයිති ඉඩමේ වැට සහ දෙවට, දකුණටඃ ගලේවත්ත, බටහිරටඃ පතන සහ මලගොඩ සහ උතුරුටඃ ඉතතුන්ගෙදර කවරල වෙදරල ඉඩමේ ගල් වැට යන මායිම් තුළ වූ අමුනු පහයි දෙකයි ලාස් පහක් වූ ඉඩම් කොටස සහ බලයලත් මිනින්දෝරු ජී. ඊ. ද ලමොත්තේ විසින් මැන සාදන ලද 1991 මාර්තු මස 26 දිනැති පිඹුර ප්‍රකාර කඩුවෙලමුල්ල ගලේමුදුන, කෙහෙල්බිබිල පුහුකෙස්ගෙමුල්ලහේන සහ උඩහේවත්ත නැමති ඉඩමට මායිම්, උතුරටඃ රජයේ ඉඩම සහ පුංචිඑතෙනාට අයිති ඉඩම, නැගෙනහිරටඃ සුන්දෙරගෙදර මැනිකෙරාට අයිති කෙහෙල්බැබිල, දකුණටඃ පාර සහ යාලවත්ත, බටහිරටඃ රජයේ ඉඩම යන මායිම් තුළ වූ අක්කර දෙ ාලහයි රූඩ් තුනයි පර්චස් හයයි (අ. 12 රූ.3 පර්.6) විශාලත්වයෙන් යුතු වැවිලි, ගොඩනැගිලි සහ ඒ මත පිහිටි සියලු දේ සමග ඉඩම

මෙය ගම්පොල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම්/ පත්‍රිරුව A 14/33 හි ලියා පදිංචි වී ඇත.
ඉහත සඳහන් ඉඩම මෑතකදී පහත සඳහන් අයුරින් මැන විස්තර වේ.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පස්බාගේ කෝරළේ, වරකාව ගමේ පිහිටි පොලනේගොල්ල වත්ත (සර්වේ ජනරාල් විසින් මැන සාදන ලද පීපී 8830 දරන පිඹුරේ දැක්වෙන කැබලි අංක 10 ඇතුළත්ව) නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. කේ. ඩබ්ලිව්. කරුණාරත්න විසින් මැන සාදන ලද අංක 128 සහ 1988 සැප්තැම්බර් මස 15 වන දින දරන පිඹුරෙහි නිරූපිත ලොට් 1 දරන බිම් කොටස සඳහා මායිම් උතුරටඃ මහ 4171 දරණ පිඹුරේ කැබලි අංක 25, 24, 23, P P 8830 පිඹුරේ කැබලි අංක 10 නැගෙනහිරටඃ P P 8830 දැක්වෙන කැබිලි අංක 4, 5, 12 සහ මහ 3347 දරණ පිඹුරේ කැබලි අංක 13 සහ ප්‍රධාන මාර්ගයද, දකුණටඃ අලුත්වත්ත ද, බස්නාහිරටඃ පොලොන්ගොල්ල වත්තහි ඉතිරි කොටසද සහ නාවලපිටිය සිට වෙරලුගස්හින්න දක්වා දිවෙන පාරද යන මායිම් තුළ වූ අක්කර දොළහයි පර්චස් හයයි දශම හයයි තුනක් (අ12. රූ0. පර් 6.63) විශාලත්වයෙන් යුතු ඉහත පිඹුර ප්‍රකාර ඉඩම

මෙය ගම්පොල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම්/ පත් ඉරුව A 67/125 හි ලියාපදිංචි වී ඇත

දේපළට පිවිසීම: නාවලපිටිය නගරයේ සිට ගම්පොල දෙසට කි.මී. 1 1/2 ගොස් දෙවන දුම්රිය හරස් මාර්ගයත් සමගම වම් දෙසට ඇති පාරෙන් මීටර් 700 ගියපසු හමුවන පොලොන්ගොල්ල වත්ත නැමති ඉඩමෙන් කොටසක් වේ.

ගෙවීම් ක්‍රමය: වෙන්දේසිය අවසානයේදී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය. (1) ගැණුම් මිලෙන් 25%; (2) පළාත් අධිකාරියේ බදු සඳහා 1%;(3) ප්‍රචාරණ වියදම්; (4) සිවිල් නඩු විධාන සංග්‍රහයේ අංක 258 වගන්තියේ (අ) යටතේ අයකිරීම් ද, ගැණුම් මිලෙන් 75% ක් වූ ඉතිරිය, වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත කොළඹ පිහිටි සිවිල් මහාධිකරණයේ ඉහත නඩුවට බැර කල යුතුය. ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල නියමිත කාලසීමාව ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට පැමිණිලිකරුට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිපුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න. අංශ ප්‍රධානි - නීති සහ අයකිරීම්, පීපල්ස් මර්චන්ට් ෆයිනෑන්ස් පීඑල්සී - අංක 21, ගාළු පාර, කොළඹ 2.

දුරකථන: 011 - 7666333

ටී. අයි. වික්‍රමආරච්චි,
නියෝජ්‍ය පිස්කල් සමාදාන විනිශ්චයකාර
රෙජිස්ට්‍රාර්,
දිසා/ මහෙස්ත්‍රාත් අධිකරණය, නාවලපිටිය.

වර්ෂ 2021 ක් වූ නොවැම්බර් මස 12 වැනි දින,
නාවලපිටිය දිසා අධිකරණයේ දී ය.

11-650

# විවිධ දැන්වීම්

## කොළඹ දී සිය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන බස්නාහිර පළාත්බඳ මහාධිකරණයේ දී ය.

| | | |
|---|---|---|
| නඩු අංකය | : | CHC/82/2021/CO |
| ස්වභාවය | : | ඈවර කිරීම |
| වටිනාකම | : | රු. 46,190,002.78 |

1939 සමාගම් ගනුදෙනු බේරා වසා දැමීමේ රීතින් හා සමඟ කියැවෙන පනත සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ 272 වැනි වගන්තිය යටතේ හා ප්‍රකාරව ඈවර කිරීම සඳහා අයදුම් කිරීම පිළිබඳ කාරණාවේ දී ය.

ඩබ්ලිව්. යූ. සෙනෙවිරත්න ඇන්ඩ් කොම්පණි (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 113, දෙපානම,
පන්නිපිටිය.

1939 සමාගම් ගනුදෙනු බේරා වසා දැමීමේ රීතින් හා සමඟ කියැවෙන පනත සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ 272 වැනි වගන්තිය යටතේ හා ප්‍රකාරව ඈවර කිරීම සඳහා අයදුම් කිරීම පිළිබඳ කාරණාවේ දී ය.

අබාන්ස් ෆිනෑන්ස් පීඑල්සී,
අංක. 498, ගාළු පාර,
කොළඹ 03.

සහ දැනට

අංක 456,
ආර්. ඒ. ද. මැල් මාවත,
කොළඹ 03.

*-පෙත්සම්කරු-.*

කොළඹ දී පැවැත්වෙන හා සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන බස්නාහිර පළාත්බඳ අධිකරණය මඟින් ඉහත නම සඳහන් ඩබ්ලිව්. යූ. සෙනෙවිරත්න ඇන්ඩ් කොම්පණි (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම ඈවර කිරීම සඳහා වන පෙත්සමක් ඉහත නම සඳහන් පෙත්සම්කරු විසින් 2021 නොවැම්බර් මස 03 වැනි දා එකී අධිකරණය වෙත ඉදිරිපත් කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ. එකී පෙත්සම 2022 ජනවාරි මස 31 වැනි දා විමසීමට ගැනීමට නියම කොට ඇති අතර, එකී සමාගමේ කිසියම් ණය හිමියකු හෝ සේවාදායකු හෝ එකී පෙත්සම පිළිබඳ නියෝගයක් නිකුත් කිරීමෙහි ලා පක්ෂ වීමට හෝ විරුද්ධ වීමට බලාපොරොත්තු වේ නම්, නඩුව විභාග වන අවස්ථාවට සිය නීති දේශක, නිතීඥ තැන මගින් ඒ සඳහා පුද්ගලිකව පෙනී සිටිය හැකි අතර, පෙත්සමේ පිටපතක් අවශ්‍යවන ඕනෑම ණය හිමියෙකුට හෝ සේවාදායකුට, ඒ සඳහා නිර්දේශිත ගාස්තුව ගෙවූ විට පහත අත්සන් කරන අය විසින් ලබා දෙනු ඇත.

ශිරන්ති ගුණවර්ධන ඇසෝසියේට්ස්,
පෙත්සම්කරුගේ ලේඛනගත නීතිඥ,
අංක. 22/1,එලියට් පෙදෙස, කොළඹ 08.

*සටහන* - මෙම නඩුව විමසීමට ගන්නා අවස්ථාවට පැමිණ සිටීමට බලාපොරොත්තු වන යම් අයෙක් වේනම්, එසේ කිරීමට කැමැත්ත දක්වමින් තම අත් අකුරින් ම ලියූ නිවේදනයක් පෙත්සම්කරුගේ ඉහත නම සඳහන් ලියාපදිංචි නීතිඥවරයා වෙත තැපැල් මගින් එවීම හෝ ගෙනැවිත් භාර දීම කළ යුතුය. එම නිවේදනයේ පුද්ගලයාගේ නම හා ලිපිනය, සමාගමක් නම් සමාගමේ නම හා ලිපිනය සඳහන් කොට පුද්ගලයා හෝ සමාගම හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ නීතිඥයා (සිටීනම්) විසින් අත්සන් කොට ගෙනැවිත් භාර දීම හෝ තැපැල් මගින් එවන්නේ නම් ඉහත නම සඳහන් අය වෙත කල්වේලා ඇතිව 2022 ජනවාරි මස 30 වැනි දින සවස හයේ (ප.ව. 6.00) කණිසමට පෙර තැපැල් කිරීම හෝ කළ යුතුය.

පෙත්සම්කරුගේ ලේඛනගත නීතිඥ.

11-656

---

**කොළඹ දී සිය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන බස්නාහිර පළාත්බඳ මහාධිකරණයේ දී ය.**

| | | |
|---|---|---|
| නඩු අංකය | : | CHC/82/2021/CO |
| ස්වභාවය | : | ඈවර කිරීම |
| වටිනාකම | : | රු. 13,061,555.59 |

1939 සමාගම් ගනුදෙනු බේරා වසා දැමීමේ රීතීන් හා සමග කියැවෙන පනත සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ 272 වැනි වගන්තිය යටතේ හා ප්‍රකාරව ඈවර කිරීම සඳහා අයදුම් කිරීම පිළිබඳ කාරණාවේ දී ය.

අබාන්ස් ෆිනෑන්ස් පීඑල්සී
අංක. 498, ගාලුපාර,
කොළඹ 03.

සහ දැනට

අංක 456,
ආර්. එල්. ද මැල් මාවත,
කොළඹ 03.

*-පෙත්සම්කරු-.*

එදිරිව

එල්. එච්. පියසේන ඇන්ඩ් කොම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 151, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ 05.

*-වග උත්තරකරු-.*

කොළඹ දී පැවැත්වෙන හා සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන බස්නාහිර පළාත්බඳ අධිකරණය මගින් ඉහත නම සඳහන් එල්. එච්. පියසේන ඇන්ඩ් කොම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම ඈවර කිරීම සඳහා වන පෙත්සමක් ඉහත නම සඳහන් පෙත්සම්කරු විසින් 2021 නොවැම්බර් මස 03 වැනි දා එකී අධිකරණය වෙත ඉදිරිපත් කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ. එකී පෙත්සම 2021 දෙසැම්බර් මස 16 වැනිදා විමසීමට ගැනීමට නියම කොට ඇති අතර, එකී සමාගමේ කිසියම් ණය හිමියකු හෝ සේවාදායකු හෝ එකී පෙත්සම පිළිබඳ නියෝගයක් නිකුත් කිරීමෙහි ලා පක්ෂ වීමට හෝ විරුද්ධ වීමට බලාපොරොත්තු වේ නම්, නඩුව විභාග වන අවස්ථාවට සිය නීති දේශක, නිතිඥ තැන මගින් ඒ සඳහා පුද්ගලිකව පෙනී සිටිය හැකි අතර, පෙත්සමේ පිටපතක් අවශ්‍යවන ඕනෑම ණය හිමියෙකුට හෝ සේවාදායකයකුට, ඒ සඳහා නිර්දේශිත ගාස්තුව ගෙවූ විට පහත අත්සන් කරන අය විසින් ලබා දෙනු ඇත.

ශිරන්ති ගුණවර්ධන ඇසෝසියේට්ස්,
පෙත්සම්කරුගේ ලේඛනගත නීතිඥ,
අංක. 22/1,එලියට් පෙදෙස, කොළඹ 08.

*සටහන* - මෙම නඩුව විමසීමට ගන්නා අවස්ථාවට පැමිණ සිටීමට බලාපොරොත්තු වන යම් අයෙක් වේනම්, එසේ කිරීමට කැමැත්ත දක්වමින් තම අත් අකුරින් ම ලියූ නිවේදනයක් පෙත්සම්කරුගේ ඉහත නම සඳහන් ලියාපදිංචි නීතිඥවරයා වෙත තැපැල් මගින් එවීම හෝ ගෙනැවිත් භාර දීම කළ යුතුය. එම නිවේදනයේ පුද්ගලයාගේ නම හා ලිපිනය, සමාගමක් නම් සමාගමේ නම හා ලිපිනය සඳහන් කොට පුද්ගලයා හෝ සමාගම හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ නීතිඥයා (සිටීනම්) විසින් අත්සන් කොට ගෙනැවිත් භාර දීම හෝ තැපැල් මගින් එවන්නේ නම් ඉහත නම සඳහන් අය වෙත කල්වේලා ඇතිව 2021 දෙසැම්බර් මස 15 වැනි දින සවස හයේ (ප.ව. 6.00) කණිසමට පෙර තැපැල් කිරීම හෝ කළ යුතුය.

පෙත්සම්කරුගේ ලේඛනගත නීතිඥ.

11-698

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.